# 18. ශුද්ධ බයිබලයේ මූලාශ්‍ර

**ශුද්ධ ග්‍රන්ථයක් ලෙස බයිබලය ලියැවී ඇති මූලාශ්‍ර සොයා බලමින්, එය දේව අනුහසින් ලියැවී ඇති බව තේරුම් ගැනීම මෙම පාඩමින් අපේක්ෂිත ය.**

(පන්ති කාමරයක් තුළ,)

දමිතා : නිර්මලා මේ බලන්න, මම අද ගෙදරින් ගෙනාපු පොත

නිර්මලා : අනේ හරිම ලස්සනයි. (පොත ගෙන පිට කවරය කියවයි) "දීප්ත ළමා මග" මොකක්ද දමිතා මේ?

දමිතා : මේක ළමයින් වෙනුවෙන් ලියා තිබෙන බයිබලයක්. මේ බලන්න, බයිබලයේ කථා ලස්සන පින්තූරත් එක්කම තියෙනවා.

(ගුරුතුමිය පංතියට පැමිණෙයි)

ගුරුතුමිය : සුභ උදෑසනක් වේවා දරුවනි!

සිසුන් : සුභ උදෑසනක් වේවා!

නිර්මලා : මේ බලන්න ටීචර් දමිතා අමුතු ම බයිබලයක් ගෙනත්.

ගුරුතුමිය : ආ, දීප්ත ළමා මග නේද? ඔය ලංකාවේ බයිබල් මුද්‍රණය කරන බයිබල් සමාගම ළමයි වෙනුවෙන් ම ලියූ එකක්.

දමිතා : මේක මට ගිය සැරේ නත්තලට පුංචි අම්මා තෑගි දුන්නේ.

ගුරුතුමිය : හරි ම වටිනා තෑග්ගක් ඔයාට ලැබී තියෙන්නේ. හොඳයි දැන් හැමෝ ම වාඩිවෙන්න. අද මම, මේ විදියට බයිබල් ලියවෙන්නට ඉස්සර, එහි මූලාශ්‍ර ගැන විස්තරයක් කරන්නටයි යන්නේ. හොඳයි ඉස්සෙල්ල ම ඔයගොල්ල කියන්න බයිබලය ගැන ඔයාලා දන්නේ මොනවා ද?

චාමීනි : බයිබලය දේව වචනය කියලා බයිබල් පාසලේ මට උගන්වන අක්කා කෙනෙක් කියලා දුන්නා.

ගුරුතුමිය :ඔව්, බයිබලය දෙවියන් වහන්සේගේ වචනය හැටියට හඳුන්වනවා. ඒ වගේම බයිබලය ලියූ විවිධ අයට දෙවියන් වහන්සේ පිළිබඳ ලියන්නට දේව මගපෙන්වීම දී තිබෙනවා. ඒකට අපි කියනවා දේවානුභාවයෙන් ලියවිලා කියලා. මුළු බයිබලයම ලියැවෙන්න අවුරුදු 1000 ක විතර කාලයක් ගත වෙලා තියෙනවා.

මිහිරි : බයිබලය ලොකු පොතක්. අපේ සීයා හැමවෙලාවෙ ම බයිබලය ගැන කියන්නේ 'ශුද්ධ' පොතක් කියලයි.

ගුරුතුමිය : ඔව් බයිබලය දෙවියන් වහන්සේගේ වචනය නිසා, එය ශුද්ධ පොතක් හැටියට හඳුන්වන එක හරියට ම හරි! බයිබලයට දීර්ඝ ඉතිහාසයක් තියෙනවා. ග්‍රීක් භාෂාවෙන් මෙය හඳුන්වන්නේ 'බිබ්ලියා' කියලයි. එහි තේරුම 'පොත්' යන්නයි. මුල් කාලයේ පටන් ශුද්ධ ලියවිලි ගල් පුවරුවල පැපිරස් පත්‍රවල හා පදම් කළ හම්වල ලියැවී තිබෙනවා. ඒ ගැන අපි දැන් සොයා බලමු.

රොහාන් : බයිබලයේ ආඥා දසය ගල් පුවරුවල ලියලා තිබුණා කියලා නේද කියන්නේ?

ගුරුතුමිය : අන්න හරි රොහාන්. නික්මයාම 31 :18, අපි කියවලා බලමු.

**උන්වහන්සේ සීනයි කන්ද මත**
**මෝසෙස් සමග කථාකොට නිම කළ පසු**
**දේව ඇඟිල්ලෙන් ලියන ලද**
**ගල් පුවරු වන ගිවිසුම් පුවරු දෙක ඔහුට දුන් සේක.**
**නික්මයාම 31: 18**

දමිතා : ඔව් එතැන තියෙනවා "ගල් පුවරු මත ගිවිසුම් පුවරු" කියලා.

ගුරුතුමිය : ආදී යුගයේ ගලක් පැතලි ලෙස සාදලා, පුවරුවක් ලෙස සකස් කර ගන්නවා. මේවා මුලින් ම මෝසෙස් තුමාගේ කාලයේ දී ලියවිලා කියලයි විශ්වාස කරන්නේ.

මේ බලන්න මෙන්න මෙවැනි ගල්පුවරුවල දේව වචනය සඳහන්ව තිබී සොයාගෙන තිබෙනවා.






ගල් පුවරු

දමිතා : ඒත් මේවා උස්සගෙන යන්න අමාරුයි නේ. ඒ වගේ ම කොච්චර කියලා ගල් පුවරු හදන්න ද?

ගුරුතුමිය : ඒක හරි. ගල් පුවරුවලට අමතරව "පැපිරස් පත්" වලත් දේව වචනය ලියැවී තිබෙනවා.

සුගත් : පැපිරස් පත්! අමුතුම නමක්, ඒ මොනවා ද?

ගුරුතුමිය : පැපිරස් කියන්නේ නයිල් ගඟ ළඟ වැඩෙන කඳ තුන් පැත්තකින් ඇති ගහක කොළ. ඒ කොළ ගහෙන් වෙන් කරලා, වේළලා තළලා ලියන්නට පාවිච්චි කළා. බයිබලයේ බොහෝ කොටස් ඒවායේ ලියලා තිබුණා. 'වෙළුමක්' හැටියට, ඒ කියන්නේ කොලෙන් කොලේ සම්බන්ධ කරගෙන ලියලා තිබුණේ. මෙය "හැකුළුම් පත්" හැටියට හඳුන්වනවා.

රොහාන් : කොච්චර අමාරු වැඩක් ද ඒක. කොච්චර මහන්සි වෙන්න ඇති ද?

ගුරුතුමිය : ඔව් හුඟාක් අමාරු වැඩක්. ඒත් ඒ අය ඒක කළා. මේ බලන්න පැපිරස් පත්වල දේව වචනය ලියැවිලා තිබෙන හැටි.



පැපිරස් පත



හැකුළුම් පත්

ගුරුතුමී : මේ වාගේ පැපිරස් ලේඛන 1947 අවුරුද්දේ මළ මුහුද ළඟ කුම්රාන් කියන තැනින් අවුරුදු 2000 ක් පමණ පැරණි ඒවා ලැබිලා තියෙනවා.

දමිතා : මේවා විනාශ නොවී තියාගත්තේ කොහොම ද? ඒ අය කොච්චර නම් මහන්සි වෙන්න ඇති ද?

ගුරුතුමිය : ඒක හොඳ ප්‍රශ්නයක්. ඒ කාලේ මැටි භාජන හදලා ඒවා ඇතුළේ ශුද්ධ ලියවිල්ල ලියූ ලියවිලි දමලා ආරක්ෂා කරගෙන තිබෙනවා. මිහිරි, බලන්න ජෙරමියා 32 : 15 පදය කියවන්න.

**ඉශ්‍රායෙල්වරුන්ගේ දෙවි ස්වාමින් වහන්සේ**
**මේ ඔප්පු, එනම් මුද්‍රාව තැබූ මිලේට ගැනීමේ ඔප්පුවත්,**
**විවෘත ඔප්පුවත් රැගෙන, බොහෝ කල් පවතින පිණිස**
**මැටි භාජනයක තබන්නට නියම කර ඇත.**
**ජෙරමියා 32 : 14**

ජනිත් : ඒ වගේ මැටි භාජන තිබුණ බවට ඒක හොඳම උදාහරණයක්. ඒත් මේ පරණ පිළිවෙළට නෙවේ අද බයිබලය තියෙන්නේ. එකේ හුඟාක් කතන්දර, සිද්ධි කොළවල ලියවිලා තියෙනවානේ.

ගුරුතුමිය : ඊශ්‍රායෙල් සෙනඟ දෙවියන් වහන්සේ එයාලට කළ බලවත් ක්‍රියා මතකයේ තියාගත්තා. එසේ ම ශුද්ධ ලියවිල්ල දෙවියන් වහන්සේ ම දුන්න බව විශ්වාස කළා. දැන් අපි යෙසායා 59 : 21 පදය කියවමු.

**'නුඹලා කෙරෙහි පවරා ඇති මගේ ආත්මානුභාවය ද,**
**නුඹලාගේ මුවෙහි තබන ලද මාගේ වචනය ද,**
**නුඹලාගේ මුඛයෙන්වත්,**
**නුඹලාගේ දරුවන්ගේ මුඛයෙන්වත් . .**
**පහව නො යන්නේ ය.'**
**යෙසායා 59: 21**

දමිතා : ඒක නම් පුදුම මතකයක්!

ගුරුතුමිය : ඔව්, එහෙම මතක තියාගෙන ඒ ගොල්ලන්ගේ දරුවන්ට කිව්වා. ඒ විදියට පරම්පරාවෙන් පරම්පරාවට ඒවා මතක තියාගත්තා. ඒකට අපි කියන්නේ "වාචික සම්ප්‍රදාය" (මුඛ පරම්පරාගත සම්ප්‍රදාය) කියලයි. ඒ කියන්නේ ඒ දේවල් කටින් කට පවත්වා ගෙන එමින් මතකයෙන් ආරක්ෂා

කරගැනීමයි. මෙසේ ඔවුන්ට පසුව දේව වචනය ලියා තබා ගැනීමට අවශ්‍යතාව මතු වුණා. දෙවියන් වහන්සේ ඒවා ලියන්න මග පෙන්වූවා. මෙන්න මේ පහත කාරණාවලින් ඔබට පෙනේවි එසේ ලිවීමේ වැදගත්කම කුමක් ද කියලා.

- වාචික සම්ප්‍රදායෙන් (මුඛ පරම්පරාගතව) පැමිණි දේව වචනය නො වෙනස්ව තබා ගන්නට.
- ඒ තුළින් බොහෝ දෙනකුට තේරුම් ගැනීම පහසු කරන්නට.
- ඉදිරි පරම්පරාවට ලිඛිතව එය ලබා දීමට.
- බැබිලෝනීය විප්‍රවාසීව සිටි ඉශ්‍රායෙල් සෙනඟ පෙරළා ඇවිත් නැවත දේව මාලිගාව ගොඩනගන්නට ගත්තා. ඒ සඳහා ද ඔවුන්ට දේව වචනයේ මඟ පෙන්වීම අවශ්‍ය වුණා.
- දෙවියන් වහන්සේම දේව වචනය ලියා තබන්නට පවසා එහි අවශ්‍යතාව පෙන්වූ සේක.

**'මා නුඹට කී සියලු වචන පොතක ලියන්න.' (ජෙරමියා 30 : 02)**

- පොතක ලිවීමෙන් එය සුරක්ෂිත වෙයි.
- එවිට එය දේව නමස්කාරයේදීත් භාවිතා කළ හැකි වෙයි.

එම නිසා ශුද්ධ බයිබලය කිතුනු අපට වටිනා ම ග්‍රන්ථයයි. එය දේවාත්මානුභාවයෙන් ලියා ඇති නිසා අපේ ජීවිතයට මහත් උපකාරයක් වෙයි. ශුද්ධ බයිබලය දිනපතා කියවන්නට, ඒ ගැන මෙනෙහි කරන්නට අපි හැම පුරුදු විය යුතුයි.

ඉන් අපේ ජීවිතවලට මහත් සවියක් ලැබෙනු ඇත. මෙසේ ශුද්ධ ලියවිල්ලෙන් මඟ පෙන්වීම ලබමු. එය ජීවිතයට ආලෝකයක් කර ගනිමු.

**ක්‍රියාකාරකම**

1. ඔබ ඉගෙන ගත් ලෙසට ශුද්ධ ලියවිල්ල මුලින්ම ලියැවී තිබුණේ කෙලෙස ද?
2. වාචික සම්ප්‍රදායෙන් පැවැතුණ දේව වචනය ලිවීමෙන් ලැබුණු විශේෂ ප්‍රයෝජන 5 ක් ලැයිස්තු ගත කරන්න.